**ආයුර්වේද වෛද්‍ය සභාව - 2025**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි සභාවේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

මතය සඳහා සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සභාව සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සභාව සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව. | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ III වන කොටස | | | |
| (i) 11(1)(ඉ) වගන්තිය | ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ඔවුන් අතරින් තෝරා පත්කර ගනු ලැබූ සමාජිකයන් තිදෙනෙකු සභාවේ සමාජිකයන් ලෙස පත්කළ යුතු නමුත් එම සමාජිකයන් තිදෙනා පත් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | 1963 මාර්තු 15 දිනැති 13564 අංක දරන ගැසට් පත්‍රය ප්‍රකාරව ඡන්ද විමසීම සඳහා අධික වියදම හා ක්‍රමවේදය කාලානුරූප නොවීම මත එය අපහසු බැවින් 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ අදාළ කොටස් ඉදිරියේ දී සිදු කරනු ලබන පනත් සංශෝධනයකදී මේ පිළිබඳව අවධානය යොමු කරන බව. | ආයුර්වේද පනතට අනුව කටයුතු කළ යුතු අතර එසේ කටයුතු කළ නොහැකි වන ප්‍රායෝගික දුෂ්කරතා ඉවත් කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. මෙය වසර ගණනාවක සිට පෙන්වා දී ඇති අඩුපාඩුවක් බැවින් ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කල යුතුය. |
| (ii) 18 (ඇ) හා (ඈ) වගන්ති | 2025 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිව තිබුණු හෙද නිලධාරින් සංඛ්‍යාව 39ක් හා ඖෂධවේදීන් සංඛ්‍යාව 260ක්වූ අතර ලියාපදිංචිය කාලානුරූපව අලුත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු බැවින් එම සංඛ්‍යා යාවත්කාලීන වී නොතිබුණි. ආයුර්වේද වෛද්‍ය | 2025.01.01 දින පත් කරන ලද නව ආයුර්වේද වෛද්‍ය සභාව විසින් රජයේ හෙද විද්‍යාල මඟින් පුහුණුව ලබන හෙද නිලධාරීන් හෙද සභාවේ ලියාපදිංචිය ලබා ඇති බැවින් ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීම අනිවාර්ය නොවිය යුතු බව 2025.09.09 දින රැස් වූ සභාව තීරණය කරන ලද අතර ආයුර්වේද වෘත්තිකයින් ලියාපදිංචි | පනතේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු අතර එසේ කටයුතු කළ නොහැකි වන ප්‍රායෝගික දුෂ්කරතා ඉවත් කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. මෙය වසර ගණනාවක සිට පෙන්වා දී ඇති අඩුපාඩුවක් වන බැවින් ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ක්ෂේත්‍රයට සුවිශේෂ වූ හෙද නිලධාරින් බඳවා ගෙන පුහුණු කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම වෙනුවට බටහිර වෛද්‍ය ක්‍රමවේද යටතේ පුහුණුව ලැබූ හෙද නිලධාරින් 100ක් ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා බඳවා ගෙන තිබුණද, පනතේ අරමුණු අපේක්ෂිත මට්ටමින් ඉටුකර ගැනීමට නොහැකිවි තිබුණි. | කිරීමේ ක්‍රමවේදය සමාලෝචනය කිරීමේ අනු කමිටුව මඟින් ආයුර්වේද ඖෂධවේදීන් නියාමනය කිරීම සම්බන්ධයෙන් සමාලෝචනය කරමින් පවතී. 2026.01.13 දින සිට ආයුර්වේද ඖෂධවේදීන් ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇති බව. | |
| (iii) | 19(1)(අ) වගන්තිය | සභාව විසින් එම සභාවේ ලේකම් වශයෙන්ද කාර්ය මණ්ඩලයේ ප්‍රධාන නිලධාරියා වශයෙන්ද කටයුතු කළ යුතු ලේඛකාධිකාරිවරයෙකු පත් කළ යුතු වුවද, එම තනතුරට ස්ථිර පදනමින් ලේඛකාධිකාරීවරයකු පත් කිරීමට කටයුතු නොකර කොන්ත්‍රාත් පදනමට සහ වැඩ බැලීමේ පදනමට දිගින් දිගටම බඳවා ගැනීම් සිදුකර තිබුණි. | ආයුර්වේද වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරවරයා බඳවා ගැනීමට HM-1-1 වැටුප් කේතය අනුමත කර ඇති අතර එම කේතයට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය අනුව මූලික උපාධියට අතිරේකව අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම අනිවාර්ය බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දැනුම් දී ඇති අතර ඒ අනුව සකස් කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය 2026.02.19 දින සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලැබුණු වහාම ලේඛකාධිකාරී බඳවා ගැනීමට අදාළ කටයුතු සිදු කරනු ලබන බව. | මෙම ක්‍රියාවලිය ඉකුත් වසර ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වන නමුත් මෙතෙක් ප්‍රමාණවත් ප්‍රගතියක් දක්වා නොමැති බැවින් ආයුර්වේද පනතට අනුව කඩිනම් පියවර ගැනීමට කටයුතු කල යුතුය. |
| (iv) | 55(1)(ඉ) හා 55(2) වගන්ති | (i) 2025 ජනවාරි 01 දින පත්වූ 24 වන | පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා | ආයුර්වේද පනතට අනුව කඩිනම් පියවර |

| | | | |
|---|---|---|---|
| | නව වෛද්‍ය සභාව විසින් ගන්නා ලද තීරණයකට අනුව, 2025 පෙබරවාරි 11 දින පත් කරන ලද ආයුර්වේද වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය සමාලෝචනය කිරීමේ අනුකමිටුවේ නිර්දේශයන් ඉදිරිපත් කර ගැසට් කිරීමට කටයුතු කිරීමෙන් පසු නියමිත ලිඛිත හා වාචික පරික්ෂණයන් සිදු කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණද, 2026 පෙබරවාරි 20 දින වන විට එනම් මාස 13කට අධික කාලයක් ගතවී තිබුණද, එම කමිටු නිර්දේශයන් ඉදිරිපත් නොවීම හේතුවෙන් ලිඛිත හා වාචික පරික්ෂණ පවත්වා නොතිබුණි. | දැනට අනුගමනය කරන ක්‍රියා පිළිවෙත 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 82 වගන්තියේ 03 වන උපවගන්තිය ප්‍රකාරව විධිමත් පරිදි රජයේ ගැසට් පත්‍රයකින් ප්‍රකාශයට පත් කර නොමැති බැවින් එම නිර්ණායක නීත්‍යානුකූල නොවන බව තීරණය කිරීම හේතුවෙන් මෙම පරීක්ෂණ පැවැත්වීම තාවකාලිකව අත්හිටුවීම සිදු කර ඇති බව හා මේ පිළිබඳව නීතිමය තත්ත්වය පැහැදිලි කර ගැනීම සඳහා 2025.07.07 හා 2025.11.20 දින යන්හි නීතිපති වෙත යොමු කර ඇති අතර එම නිර්දේශ ලැබුණු පසු මෙම පරීක්ෂණ පිළිබඳ කටයුතු කරනු ලබන බව. | ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) | නව වෛද්‍ය සභාව විසින් ගන්නා ලද තීරණයට පෙර කැඳවන ලද ආයුර්වේද වෘත්තිකයන්ගේ ලිඛිත හා වාචික පරික්ෂණ සඳහා අයඳුම්පත් 2024 හා 2025 වර්ෂ සඳහා අයඳුම්කරුවන් 476ක් හා 485ක් | පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා දැනට අනුගමනය කරන ක්‍රියා පිළිවෙත 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 82 වගන්තියේ 03 වන උපවගන්තිය ප්‍රකාරව විධිමත් පරිදි රජයේ ගැසට් පත්‍රයකින් ප්‍රකාශයට පත් කර නොමැති බැවින් එම නිර්ණායක නීත්‍යානුකූල නොවන බව තීරණය කිරීම හේතුවෙන් මෙම | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | පිළිවෙලින් රු.2,426,500 ක් හා රු.2,037,000 ක් ගෙවා තිබුණි. අයදුම්පත් කැඳවන ලද අවස්ථාවේ පැවති නියමයන්/ ක්‍රමවේදයන් ප්‍රකාරව ලිඛිත හා වාචික පරීක්ෂණ පැවැත්විය යුතු වුවත්, සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පරීක්ෂණ පැවැත්වීම තාවකාලිකව අත්හිටුවීම සිදු කර ඇති බව හා මේ පිළිබඳව නීතිමය තත්ත්වය පැහැදිලි කර ගැනීම සඳහා 2025.07.07 හා 2025.11.20 දින යන්හි නීතිපති වෙත යොමු කර ඇති අතර එම නිර්දේශ ලැබුණු පසු මෙම පරීක්ෂණ පිළිබඳ කටයුතු කරනු ලබන බව. | |
| (v) | 19 සහ 50 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 18 වන වගන්තියේ (ඊ) ඡේදය යටතේ ආයුර්වේද වෛද්‍ය සභාවේ 2014 අංක 01 දරන ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් ගේ (වෘත්තීය චර්යා) රීතිවල 10 වන රීතිය | සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05කට වරක් සිය ලියාපදිංචිය අළුත් කරගත යුතු වුවද වර්ෂ 05 ඉක්මවූ වෛද්‍යවරුන් 327ක් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මුද්‍රිත මාධ්‍ය ඔස්සේ හා පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් මඟින් දැනුවත් කිරීම් සිදු කර ඇති බව හා මේ දක්වා ගෙන ඇති පියවරයන් මඟින් රාජ්‍ය සේවයේ උපාධිධාරී වෛද්‍යවරුන් ලියාපදිංචිය අලුත් කිරීමේ ප්‍රමාණතාවය ඉහල ගොස් ඇති අතර පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචිය අලුත් කිරීම සම්බන්ධයෙන් වඩා අවධානය යොමු කරමින් පවතින බව. | ප්‍රකාශිත ආයුර්වේද වෛද්‍ය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. ලියාපදිංචිය දිරිගැන්වීම සහ ලියාපදිංචිය අලුත් කිරීමේ ආදායම එකතුකර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේද අනුගමනය කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ (ඇ) ඡේදය | තොරතුරු සංනිවේදන තාක්ෂණය භාවිතය, ඩිජිටල්කරණය, මාර්ගගත සේවා සැලසීම ආදී ක්‍රමවේද හඳුන්වා දීම මඟින් සභාවේ පුනරාවර්තන හා මෙහෙයුම් වියදම් අවම කිරීම පිළිබඳව උපායමාර්ගයන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි. | පරිගණක පද්ධති නිර්මාණය කර ගැනීම සඳහා 2026.02.10 දින ආයුර්වේද වෛද්‍ය සභාවේ අනුමැතිය ලබා දී ඇති අතර 2026 වර්ෂයේ මෙම කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය | හඳුන්වාදුන් රාජ්‍ය ව්‍යාපාර සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2.3 ඡේදය ප්‍රකාරව පිළියෙල කළ යුතු උපායමාර්ගික සැලැස්ම එකී විධිවිධාන ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර අයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2.3 අනුව පිළියෙල කිරීමට කටයුතු කරනු ලබන බව. | මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.9,033,449 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප/ ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.218,629ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,252,078 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.8,697,778කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අනුකම්පිත වාර්තාව ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් දේශීය හා සිද්ධ වෛද්‍යවරුන් පුහුණු කිරීමේ අත්පොතට සමගාමී විෂය නිර්දේශයන් සකස් කිරීමද තවදුරටත් ප්‍රමාදවී තිබුණු අතර ලිඛිත හා වාචික පරික්ෂණ නොපැවැත්වීම හේතුවෙන් ලියාපදිංචි ගාස්තු හා ලියාපදිංචිය අලුත් නොකළ වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා යොමු කර ගැනීම සඳහා වර්ෂය පුරා පැවැත්වීමට යෝජිත ජංගම කාර්යාලයන්ද නොපැවැත්වීම හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි. | කම්පිත වාර්තා කෙටුම්පත 2026.02.10 දින සභාවේ අනුමැතියට යොමු කර ඇති අතර ඒ පිළිබඳ නැවත සමාලෝචනය කර කඩිනමින් මෙම කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරන බව. | අනුකම්පිත වාර්තාව කඩිනමින් ලබාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය |
| (ආ) සභාවේ නිල වෙබ් අඩවිය ක්‍රියා විරහිත වී තිබුණු අතර වර්තමානයට ගැලපෙන | සභාවේ අනුමැතිය පරිදි නව වෙබ් අඩවියක් නිර්මාණය කර ගැනීම සඳහා 2026.02.09 වන දින මිල | සභාවේ නිල වෙබ් අඩවිය කඩිනමින් සකස් කර ගැනීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| ලෙස නවීකරණය කිරීමට සැලසුම් කර තිබුණද මේ දක්වාම එම කටයුතු නිම කර නොතිබුණි. | ගණන් කැඳවා පූර්ව කරුණු පැහැදිලි කිරීමේ රැස්වීම 2026.02.18 වන දින පවත්වන ලද අතර ඒ අනුව මෙම වෙබ් අඩවිය කඩිනමින් සකස් කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව ඉටුකළ යුතු ක්‍රියාකාරකම් 48කින් ක්‍රියාකාරකම් 15ක් ආරම්භ කර නොතිබුණු අතර ක්‍රියාකාරකම් 06ක අපේක්ෂිත ප්‍රගතිය කරා ළගා වී නොතිබුණු අතර එම කාර්යයන්හි කාර්ය සාධනය සියයට 45ත් 85ත් අතර පරාසයක් ගෙන තිබුණි. | 2026 වර්ෂයට අදාළව සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම හා 2026- 2030 ආයතනික සැළැස්ම නැවත සමාලෝචනය කර සකස් කිරීමට කටයුතු කරමින් පවතින බව හා ඒ අනුව 2025 වර්ෂයේ අවසන් කර ගැනීමට නොහැකි වූ කාර්යයන් 2026 වර්ෂයේ අවසන් කිරීමට කටයුතු කරනු ලබන බව. | ක්‍රියාකාරි සැලැස්ම අනුව කාර්ය සාධනය ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |